**බුද්ධශාසන අරමුදල - 2020**

**----------------------------------**

බුද්ධශාසන අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දැක්විය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වග බලා ගනු ලැබිය යුතුය.

### 1.2 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය මඟින් ඇතුළත් කරන ලද මුදල් රෙගුලාසි 877 (2) (ඇ) රෙගුලාසිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල පනතේ 13 වගන්තිය | විගණකාධිපති විසින් පිළියෙල කරනු ලබන වාර්තාව සහ ප්‍රකාශය පාර්ලිමේන්තුවට යැවීමට කටයුතු කළ යුතු වුවත් 2016, 2017 සහ 2018 වර්ෂවල වාර්තා මෙම වාර්තාවේ දින වන විටත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2016 සහ 2017 වර්ෂවලට අදාල වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය සියළු කටයුතු සිදුකර ඇති අතර, 2018 හා 2019 වර්ෂයේ වාර්තා ද හැකි ඉක්මනින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 757 | ගිණුම් වර්ෂය අවසානයේ භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | 2022/12/31 දිනට භාණ්ඩ සමීක්‍ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර, එම සමීක්‍ෂණය සිදුකර වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව |
| (ඇ) | මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 (ආ) 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03 ඡේදය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය | අරමුදලේ අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුව තිබුණද සමාලෝචිත වර්ෂයේදී අරමුදල සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන විමසුම් ලැබී නොමැත. | ජාතික විගණන පනතේ සහ මුදල් රෙගුලාසිවල විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

## 2.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 264 අනුව සෑම ගෙවීමක්ම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබා ගත්, (අවශ්‍ය විට නිසි පරිදි මුද්දර යෙදූ) කුවිතාන්සියකින් තහවුරු විය යුතු වුවත් නියැදි පරීක්ෂාවේදී රු.1,903,671 කට අදාල ගෙවීම් සම්බන්ධයෙන් ලදුපත් ඉදිරිපත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද, ඇතැම් ගෙවීම් වවුචර් සමඟ වෙනත් ගෙවීම්වලට අදාල රිසිට්පත්/ලදුපත් පරීක්ෂා කිරීමකින් තොරව අමුණා තිබු බව ද | රු. 1,903,671/-ක ගෙවීම් වලට අදාල වවුචර් අතරින්,<br>• අතිකාල හා ගමන් වියදම් ලබා ගත් නිලධාරීන්ගෙන් එම ගෙවීම් ලද බවට තහවුරුවක් ලබා ගෙන ඉදිරිපත් කළ හැක.<br>• වෛද්‍යාධාර ගෙවීම් සිදු කළ ස්වාමීන් වහන්සේලාගෙන් බහුතරයක් ලදුපත් එවා ඇති අතර, වෙනම ගොනුවක එම ලදුපත් ගොනු කර ඇත.<br>• සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ මුදල් ගෙවීම් තහවුරු කර ගැනීම සිදු කර | සෑම ගෙවීමක්ම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබා ගත් කුවිතාන්සියකින් තහවුරු විය යුතු බව |

| | | |
|---|---|---|
| නිරීක්ෂණය විය. | විගණනයට ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දෙන ලදී.<br>• ඉදිරියේදී කරනු ලබන සියළු ගෙවීම් සඳහා එම මුදල් ලද බවට ආදායකයාගෙන් ලදුපත් ලබා ගැනීමට අවශ්‍ය උපදෙස් නිලධාරීන් වෙත ලබා දී ඇත.<br><br>බුද්ධශාසන අරමුදල මඟින් ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගය වන්නේ කලින් මස කරනු ලැබූ ගෙවීමට අදාල ලදුපත ලැබූ පසු ඊලඟ මාසයේ ගෙවීම් සිදුකිරීමයි. ඒ අනුව ගෙවීම් තහවුරු කිරීම සඳහා අදාල වවුචරය වෙත ලදුපත අමුණා අදාල වවුචර් ගොණු නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | |

## 2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලෙන් දීමනා, ආධාර වැනි ගෙවීම් කිරීමේදී බොහෝ අවස්ථාවල අදාල කාලසීමාව ඉකුත්වී මාස කිහිපයකට පසු ගෙවීම් සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය. ඒ අනුව, එකතුව රු.4,160,656 කට අදාලව මාස 04 සිට මාස 24 දක්වා ප්‍රමාදයන් සිදුවූ අවස්ථා 18 ක් විය. | බුද්ධශාසන අරමුදල මඟින් ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගය වන්නේ කලින් මස කරනු ලැබූ ගෙවීමට අදාල ලදුපත ලැබූ පසු ඊලඟ මාසයේ ගෙවීම් සිදු කිරීමයි. ඒ අනුව ලදුපත ලැබීමේ ප්‍රමාදයන් සිදුවීම මත ගෙවීම් කිරීමද ප්‍රමාද වේ. වර්තමානයේ බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී සම්බන්ධ කර ගනිමින් ඉක්මනින් ලදුපත් ගෙන්වා ගැනීමට වැඩපිළිවෙලක් සකස් කර ඇත. | අදාල ආධාර, දීමනා වැනි ගෙවීම් ප්‍රමාදයකින් තොරව ගෙවිය යුතු බව |
| (ආ) | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව අරමුදලට අයත් බෞද්ධ ධර්ම ග්‍රන්ථ තොගයේ වටිනාකම රු.6,953,882 ක් වුවද ඊට අදාලව 2016 වර්ෂයෙන් පසු සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | 2022/12/31 දිනට භාණ්ඩ හා තොග සමීක්‍ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර, එම සමීක්‍ෂණය සිදුකර වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇත. | සෑම වර්ෂයකටම වරක් තොග සමීක්ෂණයක් සිදු කළ යුතු බව |

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයට අදාළව අනුමත කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අදාළව ප්‍රගති වාර්තාවක් පිළියෙල කර නොතිබුණු බැවින් අරමුදලෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර තිබේද යන්න විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය. | 2020 වර්ෂය සඳහා කාර්යය සාධන වාර්තාවක් 84 වන පාලක මණ්ඩල වාර්තා මඟින් ඉදිරිපත් කර ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යසාධන වාර්තාවක් පිළියෙල කළ යුතු බව |